# රෝග නිවාරණය සඳහා හින්දුස්ථානි සංගීත චිකිත්සාවේ දී භාවිත කරන රාග පිළිබඳව විමර්ශණයක්

ඩබ්ලිව්.කේ. රුවින් රංගීත් ඩයස්
උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය, සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය, කොළඹ 07.

## ABSTRACT

දකුණු ඉන්දියාවේ චෙන්නායි හි රාග පර්යේෂණ මධ්‍යස්ථානය මඟින් හින්දුස්තානි සංගීත චිකිත්සාවේ දී විවිධ ලෙඩ රෝග නිවාරණය කිරීම සඳහා යොදා ගත යුතු උචිත රාග නම් කර ඇතත් එම රාග වාදනය කිරීම තුළින් ම එම රෝග නිවාරණය සඳහා නිවැරදි විසඳුමක් නොලැබෙන බව මවිසින් සිදු කරන ලද පර්යේෂණයකින් හෙළි විය.

එකම රාගයක් විවිධ ශිල්පීන් විසින් වාදනය හෝ ගායනය කිරීමේ දී විවිධ භාවමය වෙනස්කම් සිදුවනු දැකිය හැක. නමුත් යම් රාගයක් ශ්‍රවණය කිරීමෙන් පසුව බලාපොරොත්තතු වන ප්‍රතිඵලය ලැබීමට නම් ඊට ගැළපෙන පරිදි එම රාගය ඉදිරිපත් කරන ශිල්පියා කටයුතු කළ යුතු වේ. එසේ නොවුවහොත් එම ප්‍රතිඵලය ව්‍යර්ථ වනු ඇත.

රාගයක් ශ්‍රවණය කිරීම මඟින් කිසියම් රෝගී තත්ත්වයක් නිවාරණය කරන විට සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට නම් රෝගියාගේ මනස තුළ සිදුකළ යුතු වෙනස්කම් පිළිබඳව පළමුව අවබෝධ කර ගත යුතුය. මේ පිළිබඳව අනවබෝධයෙන් යුතුව කටයුතු සිදුකලහොත් රෝග නිවාරණය වෙනුවට රෝගී තත්ත්වය උත්සන්න වීමට ද ඉඩ ප්‍රස්ථාව ඇත. එබැවින් මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් රෝග නිවාරණයට රාග භාවිතා කිරීමේ දී අවධානය දිය යුතු ප්‍රධාන කාරණා පිළිබඳ විමර්ශණයට ලක් කෙරේ.

මේ පිළිබඳ ව මවිසින් කරනු ලැබූ පර්යේෂණයේ ප්‍රතිඵල පිළිබඳව මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් දීර්ඝ වශයෙන් පැහැදිලි කිරීමට අපේක්ෂිතය.